"එන්නත් සටනේ ජනපති පෙරමුණ ගනිද්දී සෞඛ්‍ය අංශ ඉබි ගමනේ" යනුවෙන් මව්බිම (05/11) ප්‍රධාන සිරස්තල ප්‍රවෘත්තිය පළවී තිබිණි. "රට පුරා තැනින් තැන කෙරෙන එන්නත්කරණ වැඩපිළිවෙල තුළ සෞඛ්‍ය අංශවල මන්දගාමී ස්වභාවය කොවිඩ් වසංගතයෙන් ජනතාව ගලවා ගැනීමට දැඩි බාධාවක් වී ඇතැයි සෞඛ්‍ය විශේෂඥයෝ පවසති" යනුවෙන් එම පුවත තුළ වැඩිදුරටත් සඳහන්ව තිබිණි. එසේම මව්බිම සහෝදර ඉංග්‍රීසි පුවත්පත වන සිලෝන් ටුඩේ පුවත්පතේ (05/11)"Despite China donating 600,000 doses, Only 2,000 get Sinopharm jab" යන ප්‍රධාන සිරස්තල පුවත තුළ උපසිරස්තලයක සඳහන්ව තිබුණේ, 'Health authorities' lethargy hinders curbing pandemic" යනුවෙනි. මව්බිම පුවත්පතේ මෙන්ම සිලෝන් ටුඩේ පුවත්පතේද මෙම ප්‍රධාන පුවත් සඳහා මූලාශ්‍ර ලෙසින් "සෞඛ්‍ය විශේෂඥයන්ව" දැක්වී තිබුණි.
මේ සම්බන්ධයෙන් අපගේ නිරීක්ෂණ මෙසේයි.
1) මෙම ප්‍රධාන සිරස්තල පුවත් දෙකේම එය ලියූ මාධ්‍යවේදියෙකුගේ නමක් සඳහන් වී නැත.
2) මූලාශ්‍රය කුමක්ද කියා සඳහන් කිරීමට මූලාශ්‍රයෙන් අවසර නොලැබෙන අවස්ථාවකදී අදාළ මූලාශ්‍ර සඳහන් නොකොට ලිපියක් ඉදිරිපත් කිරීම අවබෝධ කරගැනීමට හැක. කෙසේ වෙතත්, "සෞඛ්‍ය අංශ" මන්දගාමී යැයි ඉදිරිපත් කෙරෙනා මෙම පුවතේ මූලාශ්‍රය වන්නේද "සෞඛ්‍ය විශේෂඥයන්" නම්, එම මූලාශ්‍ර කවුරුන්දැයි වඩාත් පැහැදිලිව සඳහන් කිරීම ඔස්සේ පුවතේ විශ්වසනීයත්වය ඉහළ නොයන්නේද?
මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
මූලාශ්‍ර:
https://www.ap.org/.../telling-the-story/anonymous-sources
#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #EnglishPress #CeylonToday